# ‘පැරකුම්බා සිරිත’ සිංහල ප්‍රශස්ති සාහිත්‍යයේ ප්‍රමුඛස්ථානයෙහි ලා සැලකීමට බලපෑ හේතු සාධක පිළිබඳ විමසීමක්

ජී. ජී. සහන් චතුරංග පුෂ්ප කුමාර[1]

ප්‍රශස්ති සාහිත්‍යයේ ආරම්භය කවර දා සිදු වූවක් ද යන්න කිව නොහැකි ය. එය ආගමික මූලයන් ඔස්සේ උපත ලබා පසුකාලීන ව විකාශය වීමේ ප්‍රතිඵලයක් මත රාජ සභාවට පිවිසි බව සිතිය හැකි ය. භාරත දේශය කේන්ද්‍ර කොටගනිමින් වැඩුණු ප්‍රශස්ති සාහිත්‍යය ඒ අවධියේ දී ම මෙරට ස්ථාපිත නො වූවත්, අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා රචනා වූ ඇතැම් ගද්‍ය හා පද්‍ය කෘතීන්හි ප්‍රශස්ති ලක්‍ෂණ දැකගත හැකි ය. පසුකාලීන ව මෙරට ප්‍රශස්ති කාව්‍ය නොමැති අඩුපාඩුව සපුරාලමින් ප්‍රථම වරට ප්‍රශස්ති කාව්‍යයක් රචනා වන්නේ කෝට්ටේ යුගයේ දී ය. එය නමින් " පැරකුම්බා සිරිත" යි. මේ කෘතිය සිංහල සාහිත්‍යයේ විශිෂ්ට ගණයෙහි ලා සලකනු ලැබේ. එසේ වීමට බලපෑ හේතු සාධක තිබිය යුතු ය. කෝට්ටේ යුගයෙන් අනතුරු ව මහනුවර යුගයේ දී ප්‍රශස්ති කාව්‍ය ගණනාවක් විවිධ රජවරුන් උදෙසා රචනා විය. මීට අමතර ව ප්‍රභූන් උදෙසා ප්‍රභූ ප්‍රශස්ති ද, දළදා වහන්සේ උදෙසා දළදා ප්‍රශස්ති කාව්‍ය ද හමුවන්නේ මහනුවර යුගයෙනි. මෙකී සමයයෙහි සිංහල ප්‍රශස්ති කාව්‍යයට සටන් මූලික කොට ගත්, ප්‍රශස්ති ස්වරූපය ගන්නා ලද "හටන් කාව්‍ය" නමින් ප්‍රශස්ති විශේෂයක් එක් විය. එබැවින් මේ කාල සීමාව ප්‍රශස්ති කාව්‍ය යුගය ලෙස සැලකීමට ඇතැම් විචාරකයෝ පෙලඹෙති. මහනුවර සමයයේ දී ප්‍රශස්ති කාව්‍ය ගණනාවක් රචනා වී පැවතිය ද සාහිත්‍යමය වශයෙන් ඒවායෙහි අගය ඉතා අඩු ය. හුදු විරහාලාප, අතිශයෝක්තියෙන් තොර යුද්ධ වර්ණනා, ශෘංගාරාත්මක බව කෙරෙහි වැඩි නැඹුරුව ආදි කරුණු සහ වෙනත් පොදු දුර්වලතා මත මේවායෙහි අගය අඩු වී ඇත. එහෙත් ඓතිහාසික තොරතුරු, යුද තොරතුරු, සමාජ තොරතුරු ආදිය ගවේෂණය කිරීමට මහනුවර යුගයේ ප්‍රශස්ති කාව්‍ය මඟින් ලැබෙනුයේ නොමඳ පිටිවහලකි. කෝට්ටේ යුගයේ දී රචනා වූ "පැරකුම්බා සිරිත" සිංහලයේ මෙතෙක් බිහි ව ආ විශිෂ්ටතම ප්‍රශස්ති කාව්‍යය යි. උසස් කවීත්වය, තැනට සුදුසු වචන අනුප්‍රාසවත් ව භාවිත කිරීම, සජීවී වර්ණනාවලින් යුක්ත වීම ආදි තවත් බොහෝ කරුණු මත, පැරකුම්බා සිරිත අනෙකුත් ප්‍රශස්ති හා හටන් කාව්‍යයන්ගෙන් වෙන් කොට දැක්විය හැකි ය. මහනුවර යුගයේ ඇතැම් ප්‍රශස්ති කවීන් පැරකුම්බා සිරිත අනුකරණය කිරීමට ගත් උත්සාහය ඒ ප්‍රශස්ති කාව්‍ය මඟින් පෙනෙතත් එය සාර්ථක වී ඇති බවක් නො පෙනේ. එසේ ම මෙහි ඇති සාහිත්‍යික සහ සමාජීය අගය අන් කිසි දු ප්‍රශස්ති කාව්‍යයකට දෙ වැනි වන්නේ නැත. එබැවින් සිංහල ප්‍රශස්ති සාහිත්‍යයේ විශිෂ්ටතම කෘතිය "පැරකුම්බා සිරිත" යැ යි හැඳින්වීම වඩාත් යෝග්‍ය වේ.

**ප්‍රමුඛ පදඃ** පැරකුම්බා සිරිත, ප්‍රශස්ති, හටන් කාව්‍ය, විරහාලාප, ඓතිහාසික

[1] සිංහල අධ්‍යයනාංශය